# චෙං-හෝගේ ලංකා ගමන් හා චීන-ලංකා සබඳතාවල ස්වරූපය

*සුධර්මාවතී, ජේ. එම්.* [1]

ශ්‍රී ලංකාව පෙරදිග ආසියාවේ රටවල් අතුරින් මුලින්ම සම්බන්ධතා පවත්වාගෙන ගොස් ඇත්තේ දිවයිනට ඈතින්ම පිහිටි චීනය සමගය. දෙරට අතර වෙළෙඳ හා ආගමික සම්බන්ධතා බහුල වශයෙන්ම පවත්වා ගෙන ගොස් තිබෙන බවට සාධක රැසකි. අනුරාධපුර රාජධානි සමයේ මුල සිට කෝට්ටේ යුගය දක්වාම දෙරට අතර මෙම සම්බන්ධතා වරින් වර පවත්වාගෙන ගොස් තිබේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ චීනයේ තුන්වන මිං අධිරාජ්‍යයා වූ යුං-ලෝ (ක්‍රි. ව. 1403-1424) විසින් චීනයේ සිට බටහිර මුහුදු ගමන්හි යෙදවූ සෙන්පතියෙකු වූ චෙං-හෝ නම් චීන නාවික යාත්‍රා නාවිකයාගේ ලංකා ගමන් නිසා ඇති වූ චීන-ලංකා සබඳතාවේ ස්වරූපය පරීක්ෂා කිරීමය. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරමින් පර්යේෂණය සිදු කර ඇත. චෙං-හෝ ක්‍රි. ව. 1405 සිට ක්‍රි. ව. 1433 දක්වා කාලය තුළදී ඉන්දියන් සාගරයට හත් වාරයක් යාත්‍රා කර තිබේ. චෙං-හෝගේ ලංකා ගමන් දෙකක් නිසා මෙතෙක් පැවති චීන-ලංකා සබඳතාවල වෙනසක් ඇති විය. ඔහුගේ පළමු ලංකා ගමන ක්‍රි. ව. 1405දීත් දෙවන ලංකා ගමන ක්‍රි. ව. 1410දී පමණ සිදු කර ඇත. මේ අතුරින් ඔහුගේ පළමු ලංකා ගමනය වෙළෙඳ කටයුතුවලටම සීමා වූවක් මිස එමගින් මෙරට දේශපාලන තන්ත්‍රයට කිසිදු බලපෑමක් සිදු වූ බවක් හඳුනාගත නොහැකිය.

මොහුගේ දෙවන ලංකා ගමනයෙදී චීන, දෙමළ හා පර්සියන් යන භාෂාවලින් රචිත '**පුවරු ලිපියක්**' රැගෙන විත් මෙරට පිහිටුවා තිබීම විශේෂත්වයකි; '**ගාලු ත්‍රි-භාෂා පුවරු ලිපිය**' නමින් ප්‍රකට වී ඇති මෙම ලිපියට අනුව මෙරට ආගමික මධ්‍යස්ථාන තුනකට පූජා භාණ්ඩ රැසක් පරිත්‍යාග කර තිබේ. ඒ වගේම මේ ගමනේදී චෙං-හෝ හා ලංකාවේ පාලකයා වූ වීර අලකේශ්වර අතර ගැටුමක් සිදු වී තිබේ. මෙහි ප්‍රතිඵලය වූයේ වීර අලකේශ්වර හා ඔහුගේ මුළු පවුලම සිරකරුවන් ලෙස චීනයට රැගෙන යාමයි. මේ තත්ත්වය තුළ කෝට්ටේ පළමුවන පාලකයා පත් කිරීමට චීන අධිරාජ්‍යයේ මැදිහත් වීමක් සිදු වී යැයි අනුමානයක් පවතී.

මේ අනුව චෙං-හෝ ගේ නාවික ගමන්හි එක් නැවතුම්පළක් ලෙස ලංකාව පත් කරගෙන තිබේ. එහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ දෙරට අතර වෙළෙඳ සම්බන්ධතා තව දුරටත් පවත්වාගෙන යෑම යැයි නිගමනය කළ හැකිය. මේ ගමන සම්බන්ධයෙන් තත් යුගයේ ලාංකේය පාලකයා දැක් වූ ප්‍රතිචාරයේ ස්වරූපය මත මෙරට දේශපාලන ක්ෂේත්‍රයට බලපෑම් කිරීමටද චීන අධිරාජයාට අවස්ථාවක් හිමි වූ බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** : චීනය, ශ්‍රී ලංකාව, චෙං-හෝ, වීර අලකේශ්වර, ගාලු ත්‍රි-භාෂා පුවරු ලිපිය

[1]*ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.* *sudharma@kln.ac.lk*